සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2019 වර්ෂය සඳහා පොලොන්නරුව දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ භාෂාවන්ගෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,129 - 2019 ජූනි මස 21 වැනි සිකුරාදා - 2019.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 390 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 391 |


*සැ. යු.* - (i) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජූනි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) උසස් අධ්‍යාපන (තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන) පනත් කෙටුම්පත 2019 ජූනි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 ජූලි මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූනි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

### කොළඹ දිසා අධිකරණයේ දී ය

1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

සෙලාන් බැන්ක් පීඑල්සී,
(පෙර සෙලාන් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හා සෙලාන් බැන්ක් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ)
අංක 90, ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : DDR 268/16
ස්වභාවය : ණය අයකර ගැනීම
වටිනාකම : රු. 6,005,910.40
ගම්පහ දිසා අධිකරණ ඇස්කිසි අංක : 49/2018

..........................*පැමිණිලිකරු.*

1. ශාන් හොලිඩේස් ප්‍රයිවට් ලිමිටඩ්
   අංක 27, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01.
2. නගරාජා සෙබමලේ
3. දමයන්ති සෙබමලේ
4. ස්ටීවන් ක්‍රිෂාන් සෙබමලේ

*තිදෙනාම*

අංක 12/1, A,
පල්ලිය පාර, හැඳල, වත්තල.

.......................*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ 2017/05/17 වැනි දින ඇතුළත් කරන ලද නඩු තීන්දුව අනුව මා වෙත නිකුත් කර ඇති දේපල තහනමට ගෙන විකිණීමේ ඇස්කිසියේ බලය පිට පැමිණිලිකාර බැංකුවට අයවිය යුතු රු. 6,005,901.40ක මුදලක් හා එකී වූ මුදලින් ප්‍රාග්ධන ණය මුදල ලෙස අයවිය යුතු රු. 4,858,136.98ක මුදලක් මත 2016.04.05 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා වර්ෂයකට 16.5% වෙළෙඳ පොළී ප්‍රතිශතයක් මත ගණනය කළ පොළිය ද තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත අදාළ නෛතික පොළිය ද සහ අධිකරණයේ නිලධාරියකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයත් මා විසින් දැනටමත් තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සඳහන්වන දේපල පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපල වර්ෂ 2019ක් වූ ජූලි මස 12 වැනි දින පෙ. ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රයිගම් පත්තුවේ, හැඳල කොන්වට් පාරේ පිහිටි දවුටගහවත්ත ලෙස හඳුන්වනු ලබන ඉඩමට ජී. ඒ. එච්. පිලිලහ මානක තැන විසින් වර්ෂ 1973 ඔක්තෝබර් මස 04 වන දින මැන සාදන ලද අංක 3506 A දරන සැලැස්මේ නිරූපිත කැබලි අංක C ලෙස ලකුණු කරන ලද ඉඩම් කැබැල්ල මායිම් උතුරට : ගුඩ් ෂෙපර්ඩ් කොන්වර්ට් හට අයත් දේපල, නැගෙනහිරට : කොන්වර්ට් පාර ද, දකුණට : එම පිඹුරේම ලොට් B බස්නාහිරට : ලොට් B යන මායිම් තුළ පිහිටි (අ. 0, රූ. 0, පර්. 10.50) ක වපසරියකින් යුතු ඉඩම සහ එහි පිහිටි කොන්වර්ට් පාරේ වරිපනම් අංකය 26 දරන නිවස ඇතුළු සියලු දේ ද වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B/1130/73 වං 97/318 යන වෙලුම්/පත්ඉරු යටතේ ලියාපදිංචි වී ඇත.

*දේපලට ප්‍රවේශ මාර්ගය.*- කොළඹ සිට මීගමුව දෙසට කි. මී. 11ක් පමණ පැමිණ හැඳල හන්දියෙන් දකුණට හැරී ඇලකන්ද පාරෙන් කි. මී. 1.8ක් පැමිණ වම් දෙසට ඇති කොන්වර්ට් පාරෙන් මීටර් 200ක් ගමන් කරන විට දකුණ දෙසට වන්නට ගුඩ් ෂෙපර්ඩ් බාලිකා විදුහල ඉදිරිපිට වන්නට මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 25%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%
(3) ප්‍රචාරණ වියදම්

ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට බැර කළ යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.
කළමණාකරු සෙලාන් බැන්ක්, ගම්පහ ශාඛාව.

ජී. එම්. රමනී වීරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, ගම්පහ.

2019 මැයි මස 21 වැනි දින.

06-766

---

# විවිධ දැන්වීම්

## බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය
(කොළඹ පිහිටි සහ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)

කොළඹ 00300, ගාලු පාර, සෙරන්ඩිබ් ටවර් අංක 324 හි එමෙන්ම, අංක 51, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 00700 පිහිටි සෙරන්ඩිබ් ලොජිස්ටික්ස් වර්ල්ඩ්වයිඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ වූ කාරණයේ දී ය.

නඩු අංකය : CHC 28/2019/CO.
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වැනි කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

රමනි කලුතරගේ ජයවීර,
අංක. 15, ඩල්මෙනි රෝඩ්,
නෝර්ත්බ්‍රිජ්,
NSW2063,
ඕස්ට්‍රේලියාව.

.................................*පෙත්සම්කාරිය.*

බස්නාහිර පළාත්බද මහාධිකරණය (කොළඹ පිහිටි සහ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) විසින් ඉහත නම සඳහන් සෙරන්ඩිබ් ලොජිස්ටික්ස් වර්ල්ඩ්වයිඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා අංක 15, ඩෙල්මනි රෝඩ් නෝර්ත්බ්‍රිජ් NSW 2063 ඕස්ට්‍රේලියාව හි රමනි කලුතරගේ ජයවීර විසින් වර්ෂ 2019 ක් වූ මැයි මස 24 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම වර්ෂ 2019 ජූලි මස 23 වැනි දින අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කරන ලද බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධව සහයෝගය දැක්වීමට හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ ණයහිමියකු හෝ දායකයකු එකී පෙත්සම අසන වේලාවේදී පුද්ගලිකව හෝ නීතිඥ මහතකු හෝ ලේඛණගත නීතිඥ මහතකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බවත්, මෙයින් දන්වනු ලැබේ. තව ද, ඉහත කී පෙත්සමේ පිටපතක් ඒ සඳහා වන ගාස්තු ගෙවීම මත අවශ්‍ය වන සමාගමේ සිටි ණයහිමියකු හෝ දායකයකුට පහත අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන්නේ ය.

සින්නදුරෙයි සුන්දරලිංගම් සහ බාලේන්ද්‍රා
නීතිඥවරුන් සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු,
#367 4/1, වේල්ල වීදිය,
කොළඹ 01200
දුරකථන : 011-25 444 00.

*සටහන.-*

එකී පෙත්සම ඇසීමේදී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් අයකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් නීතිඥ සමාගම වන සින්නදුරෙයි සුන්දරලිංගම් සහ බාලේන්ද්‍රා නීතිඥවරුන් වෙත ලිඛිතව හෝ පැමිණ හෝ තැපැල් මගින් භාරදිය යුතුය. පුද්ගලයින්ගේ නම් එහි නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එම පුද්ගලයා හෝ ව්‍යාපාරික ආයතනය හෝ සිය නීතිඥවරුන් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීම හා එය වර්ෂ 2019 ක් වූ ජූලි මස 22 වැනි දින පස්වරු හය (ප. ව. 6.00) ට පෙර ඉහත නම සඳහන් නීතිඥ සමාගමට ලැබෙන සේ කල්වේලා ඇතිව භාරදීම හෝ තැපැල් කිරීම අවශ්‍ය වේ.

සින්නදුරෙයි සුන්දරලිංගම් සහ බාලේන්ද්‍රා,
පෙත්සම්කාරියගේ නීතිඥවරුන්.

06-516

---

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීමේ
ඉල්ලීම් අංක : 29/2019/CO.

ගල්කිස්ස, පිරිවෙන පාර, අංක 5 හි පිහිටි ඒ කේ එන් වී කන්ට්‍රැක්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ වූ කාරණයේ දී ය

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

විකාශ් පලනියන්ඩි පිල්ලෙයි,
අංක 53- 1/1, රත්නාවලී පාර, කළුබෝවිල.

.................................*පෙත්සම්කරු.*

කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා,

විකාශ් පලනියන්ඩි පිල්ලෙය,
අංක 53- 1/1, රත්නාවලී පාර,
කළුබෝවිල.

විසින් 2019 මැයි මස 24 වන දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2019 අගෝස්තු මස 08 වන දින එකී අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණයහිමියකු හෝ දායකයකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥ මහතකු හෝ ලේඛනගත නීතිඥයකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද,, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණයහිමියකුට හෝ දායකයකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ ශන්මුගම් හෙරෝෂන් කුමාර්,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 156-1/11, අලුත්කඩේ වීදිය,
කොළඹ -12.

*සටහන :-*

එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයකු, එසේ කිරීමට ඇති ඔහුගේ/ඇයගේ/එහි අදහස්, ඉහත නම සඳහන් නීතිඥ ශන්මුගම් හෙරෝෂන් කුමාර් මහතා යන අය වෙත ලිඛිතව භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතු ය. පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ලේඛනගත නීතිඥවරයාගේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එය 2018 අගෝස්තු මස 07 වැනි දින පස්වරු 6.00 ට පෙර ඉහත නම සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල් වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ තැපැල් කිරීම අවශ්‍ය වේ.

නීතිඥ ශන්මුගම් හෙරෝෂන් කුමාර්,
පෙත්සම්කරුගේ නීතිඥ.

06-613

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.